# නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

# නීති නිලධාරී

# තනතුරෙහි පුරප්පාඩු පිරවීම

මෙම අමාත්‍යාංශයෙහි පුරප්පාඩු වී පවතින නීති නිලධාරී තනතුර සඳහා පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර - නීති නිලධාරී

02. තනතුරු සංඛ්‍යාව - 01

03. සේවා ගණය - SLI - 2016

04. වැටුප් ක්‍රමය -

රු. 47615-10X1335-8X1630-17X2170-110895/- (රා.ප.ච. 03/2016 හි SLI-1)

05. **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

06. **පළපුරුද්ද**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙක් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර 03 කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

07. **වයස් සීමාව**

තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා වසර 35 ට නොවැඩි විය යුතුය.

08. **බඳවා ගැනීමේ ක්‍රමය**

විවෘත බඳවා ගැනීමකි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලැබූ අයදුම්කරු තෝරා පත්කරගනු ලැබේ. ලකුණු ලබාදීමේ ක්‍රමය ඇතුළු වැඩිදුර විස්තර සඳහා නීති නිලධාරී බඳවා ගැනීමේ පරිපාටිය www.lawandorder.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකර ඇත.

09. **බඳවා ගැනීමේ කොන්දේසි**

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ.) වන අතර, බඳවා ගනු ලබන නීති නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වනු ලැබේ.

10. **අයදුම්පත් එවිය යුතු ආකාරය**

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ www.lawandorder.lk වෙබ් අඩවියේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුසාරයෙන් A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගන්නා ලද සුදුසුකම්, පළපුරුද්ද සහ අදාළ තොරතුරු පිළිබඳ සියලු විස්තර සඳහන් කරන ලද තමා විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත, සහතික වල පිටපත් සමග **"නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කොට 2017-05-05 දිනට හෝ ඊට පෙර **ලේකම්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, 14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ අයිතිය නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

**ජගත් පී. විජේවීර**
**ලේකම්,**
**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,**
**2017-04-05**